# වාහන සැපයීම සඳහා මිල ගණන් කැඳවීම

## ඉංජිනේරු කාර්යාංශය – බස්නාහිර පළාත

<u>**බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශයේ කාර්යාල 14 ක් සඳහා කුලී පදනම මත වාහන ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම - 2020 වර්ෂය**</u>

බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශයේ, ප්‍රධාන කාර්යාලයට හා කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කයන්හි පිහිටි ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල 13 මගින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘතීන් වල අධීක්ෂණ රාජකාරී ගමන් සඳහා 2020 වර්ෂයට කුලී පදනම මත වාහන ලබා ගැනීමට බලාපොරොත්තු වේ. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සැපයුම්කරුවන්ට මිල ගණන් ඉදිරිපත් කල හැක.

<u>රියැදුරු හා ඉන්ධන සැපයීම සහ වාහන නඩත්තුව සැපයුම්කරුවන් විසින් කළ යුතුය.</u>

මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට අවශ්‍ය තොරතුරු ඉංජිනේරු කාර්යාංශයේ **ගොඩනැගිලි අංශයෙන්** කාර්යාල වේලාවන් තුලදී, දුරකථන අංක 011-2092510 / 011-2092524 / 011-2092501 ඇමතීමෙන් ලබා ගත හැක.

ආපසු නොගෙවන රු.1000/- ක මුදලක් සහ ආපසු ගෙවන රු.5000/- ක ගාස්තුවක් 2019 .12.09 දින සිට 2019.12.27 දින දක්වා ඕනෑම වැඩ කරන දිනයකදී 9.00 පැය හා 15.00 පැය අතර බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ගෙවීමෙන් පසු, ලංසු ලේඛණ කට්ටල මිලදී ගත හැකිය.

නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන කට්ටල මුද්‍රා තබා, අනු පිටපතක්ද සහිතව කවරයේ වම් පස ඉහල කෙළවරේ **" කුලී පදනම මත වාහන සැපයීම සඳහා මිල ගණන් 2020 "** යනුවෙන් සඳහන් කර 2019 දෙසැම්බර් මස 30 වැනි දින ප.ව. 1.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු), බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශය, ප්‍රධාන ලේකම් කාර්යාලය, අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ එහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ හැකිය.

ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ලංසු කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට සහභාගි විය හැක.

ලැබී ඇති ලංසු පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සියළුම අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු අතර ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති**
**නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා )ගේ**
**ප්‍රසම්පාදන මණ්ඩලය,**
**බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශය,**
**204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**බත්තරමුල්ල.**